# ශාබාවක මූලික වැඩසටහන්

නියමු පොත

# පටුන

| | |
|---|---|
| ශාඛාවක මූලික වැඩසටහන නියමු පොත හඳුන්වාදීම | 1 |
| ශාඛාවක මූලික වැඩසටහනේ ප්‍රධාන කරුණු පහ | 2 |
| 1. සංවිධානය | 3 |
| 2. රැස්වීම් ස්ථාන | 4 |
| 3. ඉගැන්වීමේ ක්‍රමය | 5 |
| 4. ඉගැන්වීම් | 6 |
| 5. වාර්තා සහ තොරතුරු | 6 |
| මූලධර්ම සහ අවධානය | 7 |
| ඉරුදින රැස්වීමේ කාලසටහන | 8 |

**බෙදාහැරීම**

*ශාඛාවක මූලික වැඩසටහන නියමු පොත,* සභාව ආරම්භක අවධියේ පැවතීම, සාමාජිකයන් විසිරී සිටීම හෝ අඩු ගණනකින් සමන්විතවීම, නායකත්වය වර්ධනයවීමට පටන්ගැනීම හෝ භාෂාව හෝ වෙනත් අවශ්‍යතාවයන් තිබෙන සාමාජිකයන් සිටින ශාඛාවන් සංවිධානයකිරීම සඳහා පූජකවරයේ නායකයන්ට මගපෙන්වීම් ලබාදෙයි. සාමාන්‍ය වශයෙන් මෙම තත්වයන් දූතමෙහෙයන් තුළ තිබුනද, එවැනි තත්වයන් තිබෙන ස්ටේක්වලටද ප්‍රාදේශීය සභාපතිත්වයේ අනුමැතිය ඇතිව, ශාඛාවක මූලික වැඩසටහන පාවිච්චිකළ හැකිය.

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
සෝල්ට් ලේක් නගරය, යූටා

© 2006 Intellectual Reserve, Inc විසිනි
සියලු හිමිකම් ඇවිරිණි

අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී

ඉංග්‍රීසි අනුමැතිය: 2/02
පරිවර්තන අනුමැතිය: 2/02
Sinhala

# ශාඛාවක මූලික වැඩසටහන හඳුන්වාදීම

"ප්‍රාක්තම සභාව හා සමාන සංවිධාන-යක් අපට ඇතැයි අපි විශ්වාස කරමු" (ඇදහිල්ලේ කරුණු 1:6).

සිය මැරෙන සුළු ජීවිතයේ සේවා කාලය තුළදී, ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්-තුස්වහන්සේ උන්වහන්සේගේ සභාව ඇදහිලිමතුන් අතර සරල අන්දමින් පිහිටුවූසේක. උන්වහන්සේ තම ප්‍රේරි-තවරුන් මගින් සාමාජිකයන් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කොට ඔවුන්ට සේවය කිරීම සඳහා මුලසුන දැරීමට පූජකවරයේ නායකයින් පත් කළසේක.

මුල්කාලීන සභා සාමාජිකයන්ට සුභා-රංචිය තුල වර්ධනයවී සමෘධිමත්වීමට හැකිවූයේ ක්‍රිස්තුස්වහන්සේ සහ උන්ව-හන්සේගේ ප්‍රේරිතවරුන් නිසායඃ

1. සුභාරංචියේ මූලධර්ම සහ දහම ඉගැන්වීම ගැන අවධානය යොමු කළහ.
2. නියෝග ලබාගෙන ඊට සම්බන්ධිත ගිවිසුම් තබා ඒවා අරක්ෂාකිරීමට සාමජිකයන් දිරිමත් කළහ.
3. එකිනෙකාගේ ආත්මික සහ ලෞකික අවශ්‍යතාවයන් වෙනුවෙන් සේවය කිරීමට සාමාජිකයන්ට ඉගැන්වූහ.
4. සංවිධානය සරල අන්දමට පවත්-වාගෙන ගියහ.

මෝර්මන්ගේ පොතේ එන සභා නායකයෝ විසින්ද එම මූලධර්ම සහ මෙහෙකිරීම් ක්‍රියාත්මකකරන ලදී. "තවද මෙසේ ඇල්මා සහ ඇමුලෙක් සහ සේවය කිරීමට තෝරාගනු ලැබූ තව බොහෝ අයද,වචනය දේශනාකි-රීමට දේශය මුළුල්ලේම ඉදිරියට ගියහ. තවද සභාව පිහිටුවීම දේශය මුළුල්ලේම සාමාන්‍ය දෙයක් බවට පත්විය" (ඇල්මා 16:15).

සභාව නැවත පිහිටුවූ මුල් කාලයේදීද එම මූලධර්මම ක්‍රියාත්මක කරන ලදී. සංවිධානය සහ සේවය කිරීමේදී මෙම මූලධර්ම අනුගමනයකිරීම මගින් අද සිටින සාමාජිකයන්ට ඉතා හොඳ සේවයක් ලැබෙන්නේය.

ප්‍රාදේශීය සභාපතිත්වයේ බලය පැවරීම අනුව, ලෝකයේ පහත සඳහන් ප්‍රදේ-ශවල සභාව පිහිටුවා සංවිධානය කිරීමේදී ශාඛාවක මූලික වැඩසටහන භාවිතා කළ හැකියඃ

1. සභාව එහි ආරම්භක අවධියේ පැවතීම.
2. සාමාජිකයන් විසිරී සිටීම.
3. සාමාජිකයන් අඩු ගණනකින් සමන්විතවීම සහ නායකත්වය වර්ධනයවීමට පටන්ගැනීම.
4. කොට්ඨාශ සහ ස්ටේකය තවමත් සංවිධානය නොවූවිටෙක.
5. සමාජිකයන්ට විශේෂ භාෂා අවශ්‍යතාවයන් සහ වෙනත් විශේෂ අවශ්‍යතාවයන් තිබීම.

ප්‍රාදේශීය සභාපතිත්වයේ අනුමැතිය ඇතිව, එවැනි තත්වයන් පවතින ස්ටේක්වල ශාඛාවක මූලික වැඩසටහන භාවිතාකළ හැකිය.

මෙවැනි තත්වයන් යටතේ සභාව පිහිටුවූවිට, සාමාජිකයන් කුඩා කණ්ඩායම්වලට සංවිධානයවූ විට ඒවා ශාඛා ලෙස හැඳින්වේ.

ශාඛාවක මූලික වැඩසටහන සඳහා මගපෙන්වීම්, මෙම ප්‍රකාශනයෙහි සහ *පවුලේ නියමු පොත* (ඒකක අංක 31180), *ශාඛා නියමු පොත* (31179), *පූජකවරයේ සහ උප ශාඛා නායකයන්ගේ නියමු පොත* (31178), සහ *ඉගැන්වීමේ නියමු පොත* (34595) මගින් ලබාදී ඇත. ශාඛාවන් සම්පූර්ණයෙන්ම ස්ටේක් සහ කොට්ඨාශවලට සංවිධානයවූ විට, ඔවුන් *සභා උපදෙස් අත් පොත* (35205 සහ 35209) භාවිතාකළ යුතුය

# ශාඛාවක මූලික වැඩසටහනේ ප්‍රධාන කරුණු පහ

ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ මුල් කාලීන සභා නායකයන්ට, ගොස් උන්වහන්සේගේ සුභාරංචිය දේශනාකිරීමට අණ කළසේක; තවද ඔවුන් උන්වහන්සේගේ ඉගැන්වීම් ලබාගන්නා ප්‍රමාණයටම, නායකයන් ස්වාමීන්වහන්සේගේ සභාව ජනතාව අතර පිහිටුවීමට කටයුතු කළ යුතුය (බලන්න දහම සහ ගිවිසුම 28:8; තවද බලන්න 33:5–6).

## 1. සංවිධානය

### පවුල



පවුල සභාවේ මූලික ඒකකය වන්නේය. පවුල සම්බන්ධව සහ නිවසේදී සුභාරංචිය අනුව ජීවත්වීමේ උපදෙස් පවුලේ නියමු පොතෙන් ලබාගැනීමට ඔබට හැකිය.

### ශාඛාව



යම් ප්‍රදේශයක පවුල් දෙකක් හෝ ඊට වැඩියෙන් සිටින විට සහ අඩු වශයෙන් එක් සාමාජිකයෙකු ආරෝනික පූජකවරයේ සුදුසු පූජකවරයෙකු හෝ සුදුසු මෙල්කිසදෙක් පූජකවරය උසුලන්නෙක් සිටින විට ශාඛාවක් සංවිධානය කළ හැකිය. ශාඛා සභාපතිවරයෙක් පමණක් සහිතව, ශාඛාවක් සරල අන්දමින් ආරම්භකිරීමට හැකිය, ඔහු සාමාජිකයන්ගේ නිවෙස්වලට ගොස් ඔවුන්ගේ රාජකාරීන් ගැන ඔවුන්ව දිරිමත්කරනු ඇත. මෙම තත්වයන් තුළ ශාඛාවේ සක්‍රමේන්තු රැස්වීම සහ ශුද්ධ ලියවිලි සහ සුභාරංචි මූලධර්ම අත්පොත (31110) හෝ ශුවිශේෂක මූලධර්ම අත්පොත (31129) භාවිතාකරමින් සුභාරංචි උපදෙස් රැස්වීමක් පමණක් ශාඛාව පවත්වනු ලබයි. 008 වනි පිටුවේ කාලසටහන බලන්න.

සභාව සාමාජිකයන්ගෙන් වැඩිවී නායකයන් සිටින විට, වැඩිහිටි ගණපූරණයක් සංවිධානයකළ යුතුය. ශාඛා සභාපතිවරයා ඉන්පසුව පූජකවරය උසුලන්නන් යොදාගෙන නිවාස ඉගැන්වීම් තුළින් සාමාජිකයන් රැකබලාගනු ඇත. ඉරුදින සුභාරංචි උපදෙස් පංති කාලය තුළදී, පූජකවරයේ රැස්වීමක්, මෙන්ම කාන්තාවන් සඳහා ඒකාබද්ධ රැස්වීමක්, තරුණ කාන්තා, සහ ළමුන් සඳහාද ඒකාබද්ධ රැස්වීමක් පැවැත්විය යුතුය. 008වෙනි පිටුවේ කාලසටහන බලන්න.

සාමාජිකත්වය සහ නායකත්වය වැඩිවෙමින් පවතින විට, සහ රැස්වීම් පහසුකම් තිබෙන විට, ආරෝනික පූජකවරයේ ගණපූර්ණ, සහ සහන සමිතිය, ප්‍රාථමිකය, තරුණ කාන්තා, සහ ඉරුදින පාසල් උප ශාඛා සංවිධානයකළ හැකිය. ඉරු දින සුභාරංචි පංති 8 වෙනි පිටුවේ ආ සහ ඇ කාලසටහන්වල පෙන්වාදී ඇති පරිදි පැවැත්විය යුතුය.

සාරාංශයක් ලෙස, වැඩසටහන ආරම්භවන්නේ පුද්ගලයෙක් හෝ පවුලක් සමගින්ය. පසුව ශාඛාවක් ආරම්භවේ. ඉන්පසුව පූජකවරයේ සාමාජිකයන් වැඩිවෙමින්, සාමාජිකත්වය වැඩිවන විට, පූජකවරයේ ගණපූර්ණ සහ පසුව උප ශාඛා සංවිධානයකළ හැකිය.

ශාඛාවක් පිහිටුවීම, සංවිධානයකිරීම, සහ මෙහෙයවීම සඳහා වැඩි විස්තර සහිත උපදෙස්, *ශාඛා නියමු පොත* සහ *පූජකවරය සහ උප ශාඛා නායකයන්ගේ නියමු පොත්* වලින් ඔබට ලබාගත හැකිය.

## 2. රැස්වීම් ස්ථාන

*පවුලේ නියමු පොතේ* පැහැදිළි කෙරෙන පවුල් නිවාස සැන්දෑවන්, පවත්වනු ලබන්නේ සාමාජිකයන්ගේ නිවාස තුළය.

ශාඛා රස්වීම්, නිවාස තුළ, කුලී ගොඩනැගිල්ලක, හෝ සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වනු ලැබේ. *ශාඛා නියමු පොතේ* පැහැදිළි කෙරෙන පරිදි, ශාඛාව සඳහා රැස්වීම් ස්ථාන ලබාගෙන පවත්වාගැනීම සඳහා තොරතුරු ලබාදීමට දූතමෙහෙයේ සභාපතිත්වයට හැකිය.



*ශාඛා රැස්වීම් නිවසක, කුලී ගොඩනැගිල්ලක,*
*හෝ සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වනු ලැබේ.*

## 3. ඉගැන්වීමේ උපකරණ

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය නිවසේදී සහ සභා ශාඛාවල ඉගැන්වීම සඳහා නියමිත අධ්‍යයන ක්‍රම සභාව විසින් ප්‍රසිද්ධකරනු ලැබේ. මෙම උපකරණ, ශුද්ධ ලියවිලි සහ පසු-දවස්වල අනාගතවක්තෘවරුන්ගේ ඉගැන්වීම් පදනම්කරගෙන ඇත. සුභාරංචිය ඉගෙනගෙන ඒ අනුව ජීවත්වීමට සාමාජිකයන්ට එමගින් උපකාර ලැබේ. ශුද්ධ ලියවිලි සහ පසු-දවස්වල ප්‍රේරිතවරුන්ගේ සහ අනාගතවක්තෘවරුන්ගේ වචන අධ්‍යයනයටද සාමාජිකයන්ට එමගින් මගපෙන්වීම් ලැබේ.

ප්‍රථම වරට භාෂාවකින් ලබා දුන් උපකරණ නම්, *සුභාරංචි මූලධර්ම* අත් පොත (හෝ *ශුවිශේෂක මූලධර්ම* අත් පොත) සහ *පළවෙනි සභාපතිත්වයේ පණිවුඩ* සහ *බැහැදැකීමේ පණිවුඩ* මගිනි. සභාව දිගටම වර්ධනයවන විට, ශුද්ධ ලියවිලි, වෙනත් ඉගැන්වීමේ උපකරණ සහ සභා සඟරා ලබා දෙනු ලැබේ.

ශාඛාවක් පූජකවරයේ සහ උප ශාඛාවල පංති පවැත්වීම දක්වා වර්ධනයවන විට, පහත සඳහන් ඉගැන්වීමේ ක්‍රම, ඒවා තිබෙන පරිදි, භාවිතාකිරීමට හැකිය.

| | |
|---|---|
| මෙල්කිසදෙක් පූජකවරය සහ ආරෝනික පූජකවරය | *පූජකවරයේ රාජකාරි සහ ආශිර්වාද, අ කොටස*<br>*පූජකවරයේ රාජකාරි සහ ආශිර්වාද, ආ කොටස* |
| සහන සමිතිය සහ තරුණ කාන්තා | *පසු-දවස්වල ශුද්ධවන්ත කාන්තාව, අ කොටස*<br>*පසු-දවස්වල ශුද්ධවන්ත කාන්තාව, ආ කොටස* |
| ප්‍රාථමිකය | *ප්‍රාථමිකය 3: හරි දේ තෝරන්න ආ*<br>*ප්‍රාථමිකය 4: මෝර්මන්ගේ පොත* |
| ඉරුදින පාසල | *සුභාරංචි මූලධර්ම (හෝ ශුවිශේෂක මූලධර්ම)* |
| *ශුද්ධ ලියවිලි, පවුලේ නියමු පොත, පූජකවරයේ සහ උප ශාඛා නායකයන්ගේ නියමු පොත, ඉගැන්වීමේ නියමු පොත, පළවෙනි සභාපතිත්වයේ පණිවුඩ, බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ,* සහ *ගීතිකා සහ ළමා ගී* යන ඉහත ලැයිස්තුගත කළ ඉගැන්වීමේ උපකරණ අවශ්‍ය පරිදි අතිරේක වශයෙන් පාවිච්චිකළ හැකිය. | |

ඉගැන්වීමේ ක්‍රමයේ වසර ලොව පුරාම ආරම්භවන්නේ ජනවාරි 1 වෙනිදාය. අදාළ ඉගැන්වීමේ උපකරණ උපදෙස්ද සමග, ශාඛාවක් සංවිධානයවූ විට සහ ඉන්පසුව වාර්ෂිකව ලබාදෙනු ලැබේ.

## 4. ඉගැන්වීම්

ආත්මික වර්ධනය සඳහා සහ පෞද්ගලික සාක්ෂි ශක්තිමත්කිරීම සඳහා නිවසේදී සහ සභා රැස්වීම්වලදී සුභාරංචි උපදෙස් අත්‍යාවශ්‍යවේ. සභාවේ සියලුම සාමාජිකයන්, දෙමාපියන්, නායකයන්, පංතිවල ගුරුවරුන්, හෝ නිවාස ගුරුවරුන් හෝ බැහැදැක ඉගැන්වීමේ ගුරුවරුන්දෟ, ගුරුවරුන්ද වෙති.

සුභාරංචිය ඉගැන්වෙන ප්‍රධාන ස්ථානය විය යුත්තේ නිවසය. නිවසට ආධාර සැපයෙන්නේ සභා රැස්වීම්වලදී ඉගෙනගන්නා ඉගැන්වීම් සහ දැනගන්නා දේවල් මගින්ය.

ස්වාමීන්වහන්සේ අපට අණකර තිබෙන්නේ රාජ්‍යයේ දහම එකිනෙකාට ඉගැන්වීමටය. උන්වහන්සේගේ අනුග්‍රහය අප වෙත ලැබීමට අප උනන්දුවෙන් ඉගැන්විය යුතුය. එවිට වඩාත් සම්පූර්ණ ලෙස, න්‍යාය, මූලධර්ම, දහම සහ සුභාරංචියේ නීතිය, සහ අපට තේරුම්ගැනීම යෝග්‍ය දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සම්බන්ද සියලුම දේවල් ගැන අපට උපදෙස් ලැබෙන්නේය (බලන්න ධීසහසී 88:77–78).

සුභාරංචිය සරළව, අලංකාරව සහ සාර්ථකව ඉගැන්වීමට ඔබට උපකාරවත්වන මූලධර්ම *ඉගැන්වීමේ නියමු පොතේ* ඇත.

## 5. වාර්තා සහ තොරතුරු

වාර්තා තබාගන්නා ලෙස ස්වාමීන්වහන්සේ සභාවට අණකර ඇතිසේක. සභාව තබාගන්නා වාර්තා වර්ග හතරඃ මූල්‍යමය වාර්තා, සාමාජිකත්ව වාර්තා, ඓතිහාසික වාර්තා, සහ සාමාජික වර්ධන තොරතුරුය.

වාර්තා තබාගන්නා උපකරණ ශාඛාවක් සංවිධානයවූ විට ලබාදෙනු ලැබේ. වාර්තා තබාගැනීම ගැන සහ වාර්තා සම්පූර්ණකර ඉදිරිපත්කිරීම ගැන උපදෙස් දූතමෙහෙයේ මගපෙන්වීම යටතේ ලබාදෙනු ඇත. මෙම පූජනීය ලේඛන පරිහරණයකරන අය සහා වාර්තාවල මෙම රහසිගත තොරතුරු ප්‍රවේශමෙන් ආරක්ෂාකළ යුතුය.

සභා වාර්තා සහ තොරතුරු පිළිබඳ වැඩිදුර තොරතුරු *ශාඛා නියමු පොතෙන්* ලබාගැනීමට ඔබට හැකිය.

# මූලධර්ම සහ අවධානය

"තවද මේ සියලු දේ ඥානවන්තව සහ පිළිවෙලකට කිරීමට වගබලාගන්න; මන්දයත්, මිනිසෙකු තම ශක්තිය ඉක්මවා දිවීම වුවමනා නොකෙරේ" (මොසායා 4:27).

පහත සඳහන් මූලධර්ම සහ අවධානයන් ශාඛාවක මූලික වැඩසටහන සාර්ථකවීමට වැදගත්වේ.

**1. ඔබ කරන සියලු දේවලදී ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවය සොයන්න.** කළ යුතු දෙය සහ එය කරන අන්දම දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ දෙමාපියන්ට, ශාඛා නායකයන්ට සහ ගුරුවරුන්ට මගපෙන්වනසේක. උන්වහන්සේගේ මගපෙන්වීම් සඳහා යටහත්ව සහ අවංකව යාච්ඤා කරන්න. යමක් ගැන ප්‍රවේශමෙන් සිතන්න, කළ යුතු දේ ගැන උනන්දුවෙන් යාච්ඤා කරන්න, ගන්නා ක්‍රියාමාර්ග මොනවාදැයි තීරණය කරන්න, හරි දේ ගැන ශුද්ධාත්මයාණන්ගේ ස්ථිරකිරීම සොයන්න. ඔබ කළ යුතු දේ කුමක්දැයි තේරුම්ගැනීමට එළිදරව්වක් උන්වහන්සේ ඔබගේ මනසට සහ හදවතට දෙනසේක.

අප යටහත් විය යුතුය; තවද ස්වාමීන්වන අපගේ දෙවියන්වහන්සේ තම හස්තයෙන් අපට මග පෙන්වා, අපගේ යාච්ඤාවලට පිළිතුරු දෙනසේක (බලන්න ධ්‍ීසහගි 112:10).

ස්වාමීන්වහන්සේ ශුද්ධාත්මයාණන් තුළින් අපගේ මනසට සහ අපගේ හදවතට කියන සේක, එය අප වෙත පැමිණ අපගේ හදවත් තුළ වාසයකරයි, එළිදරව්වේ ආත්මය මෙය වන්නේය (බලන්න ධ්‍ීසහගි 8:2–3).

**2. සුභාරංචියේ මූලික මූලධර්ම සහ දහම උගන්වන්න.** මොසායා 18:18–30 කියවන්න. ඇල්මාගේ කාලයේ මූලික මූලධර්ම සහ දහම ඉගැන්වූ අන්දම ගැන බලන්න.

**3. නියෝග සහ ගිවිසුම් කෙරෙහි යොමුවන්න.** (1) පූජකවරයේ අත්‍යාවශ්‍ය නියෝග තේරුම්ගෙන ලබාගැනීමට සහ (2) නියෝග සම්බන්ධ ගිවිසුම් තබා ආරක්ෂා කිරීමට සාමාජිකයන්ට උපකාර කරන්න.

**4. පළමුවෙන් පූජකවරය සහ පූජකවරයේ ක්‍රියාකාරීත්වය ස්ථිරව ගොඩනගන්න.** සහන සමිතිය, ප්‍රාථමිකය, තරුණ කාන්තා, හෝ ඉරුදින පාසල් උප ශාඛා වැඩ සටහන් සංවිධානය කිරීමට පෙර මෙය කරන්න. ඉතා වේගවත්ව, ඉතා ඉක්මණින් නොයන්න. පූජකවරයේ නායකත්වය ඉතා හොඳින් වර්ධනයකරගත හැක්කේ, සහා උපකාරක සාමාජිකයන්ගේ අවශ්‍යතා පරිදි හොඳින් සමබරවූ විටදීය. ශාඛා තම සංවිධාන, රැස්වීම්, සහ වැඩ සටහන් ඉතා ඉක්මණින් පුළුල්කරන විට, නායකත්වය දුර්වල බවට පත්වේ.

# ඉරුදින රැස්වීම් කාලසටහන්

රැස්වීම් කාලසටහන භාවිතාකිරීමට දුතමෙහෙයේ සභාපතිවරයා ප්‍රදේශීය සභාපතිත්වය සමග සම්බන්ධිතව අනුමැතිය දිය යුතුය.

## ඉරුදින රැස්වීම් කාලසටහන අ

ශාඛා සභාපතිවරයා පමණක් මෙල්කිසදෙක් පූජකවරය උසුලන හෝ ඔහු ආරෝ-නික පූජකවරයේ පූජකවරයෙකුව සිටින ශාඛා සඳහාය. (වැඩිහිටි ගණපූර්ණයේ සභාපතිවරයෙක් කැඳවූ විටෙක, සුභාරංචි උපදෙස් කාලයේ සැකසුම පහත සඳහන් පරිදි වෙනස්වේ: පූජකවරය උසුලන සියල්ලෝ එකට රැස්වෙති, තවද කාන්තාවෝ, තරුණ කාන්තාවෝ, සහ ළමුන් සියල්ලෝද එකට රැස්වෙති.)

| |
|---|
| සක්‍රමේන්තු රැස්වීම |
| වැඩිහිටියන්, තරුණ පක්ෂය සහ ළමුන් සඳහා සුභාරංචි උපදෙස් රැස්වීම. |

## ඉරුදින රැස්වීමේ කාලසටහන ආ

පූජක ගණපූර්ණ සහ උප ශාඛා රැස්වීම් කිහිපයක් සංවිධානකිරීම ආරම්භකිරීමට ප්‍රමාණවත් සාමාජිකයන සංඛ්‍යාවක් සිටින ශාඛා සඳහාය.

<table>
<tr><td colspan="3">සක්‍රමේන්තු රැස්වීම</td></tr>
<tr><td colspan="2">ඉරුදින පාසල (වයස 12 සහ ඊට වැඩි තරුණ අය සහ වැඩිහිටියන්)</td><td rowspan="2">ප්‍රාථමිකය<br>(වයස 3–11<br>දක්වා ළමුන්)</td></tr>
<tr><td>පූජකවරයේ රැස්වීම</td><td>කාන්තාවන් සහ තරුණ<br>කාන්තාවන් සඳහා රැස්වීම</td></tr>
</table>

## ඉරුදින රැස්වීම කාලසටහන ඇ

පූජක ගණ පූර්ණ සහ උප ශාඛා සංවිධාන වැඩියෙන් හෝ සියල්ලම ඇති කිරීමට ප්‍රමාණවත් සමාජිකයන් සංඛ්‍යාවක් සිටින සහ නායකයන් සහ රැස්වීම් ස්ථාන තිබෙන ශාඛා සඳහාය.

<table>
<tr><td colspan="5">සක්‍රමේන්තු රැස්වීම</td></tr>
<tr><td colspan="4">ඉරුදින පාසල (වයස 12 සහ ඊට වැඩි තරුණ අය සහ වැඩිහිටියන්)</td><td rowspan="3">ප්‍රාථමිකය<br>(වයස 3–11<br>දක්වා ළමුන්)</td></tr>
<tr><td colspan="2">ආරම්භක කටයුතු</td><td>ආරම්භක කටයුතු</td><td>ආරම්භක කටයුතු</td></tr>
<tr><td>මෙල්කිසදෙක්<br>පූජකවරය</td><td>ආරෝනික<br>පූජකවරය</td><td>සහන සමිතිය</td><td>තරුණ කාන්තා</td></tr>
</table>

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA
4 02367 17408 8
36717 408